මගේ අංකය: JSC/SEC/CIR/2021

**<u>අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 449</u>**

**සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් වෙත**

**<u>මහාධිකරණ වල විභාග වන ළමා අපයෝජන නඩු ගොනු සංකේතකරණය කිරීම</u>**

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ඉල්ලීමක් සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, මහාධිකරණ වල විභාග වන ළමා අපයෝජන නඩු ගොනු පහසුවෙන් සහ නිශ්චිතව හඳුනා ගැනීමට හැකි වන පරිදි, වෙනම සංකේතකරණයක් හඳුන්වා දීමට තීරණය කර ඇත.

එමගින් අධිකරණ සේවා කොමිෂන් සභාව බලාපොරොත්තු වන්නේ;

I. එම ළමා අපයෝජන නඩු නිශ්චිත දිනයක දී කැඳවෙන ආකාරයට නඩු රෝල සකස් කර ගැනීම හා

II. එම ළමා අපයෝජන නඩු සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට පහසුකරලීම

වේ.

**යෝජිත සංකේතකරණය:-**

ළමා අපයෝජන සම්බන්ධ නඩු ගොනුවේ **මුල් කවරයේ, වම්පස කෙළවරේ** නාරටියට යාබදව අඟලක පළලකින් යුත් කහපැහැති ස්ටිකරයක් (තීරුවක්) ඉහළ සිට පහළට විහිදෙන සේ ඇලවීම.

ආදර්ශ සංකේතකරණය මේ සමග අමුණා ඇත. (ඇමුණුම 01)

මෙම යෝජිත සංකේතකරණය කඩිනමින් ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඔබට දැන්වීමට අධිකරණ සේවා කොමිෂන් සභාව මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2021 ජූනි මස 28 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

← අහල් 1 →

(කහ පැහැති ස්ටිකරය)

## <u>නඩු වාර්තාවක මුල් කවරය</u>

**HC/ / 2021**

↑

නඩු අංකය

මහාධිකරණයේ නම

↓

මහාධිකරණය - ...........................